*සියලුම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

# කතෝලික ධර්මය

**07 ශ්‍රේණිය** | **කාලය පැය 02 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

**I කොටස**

- අංක 01 - 10 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ජාකොබ්තුමාගේ සහෝදරයා වන්නේ,

(1) ජුවාම්තුමා ය. (2) ඒසව්තුමා ය.

(3) ජෝසෙප්තුමා ය. (4) ඇන්ඩෲතුමා ය.

02. ආශිර්වාදකාර බන්ධනය යනු,

(1) ගිවිසුමකි. (2) නීතියකි.

(3) එකඟතාවයකි. (4) බැඳීමකි.

03. සිරියාවේ රජතුමාගේ සෙන්පතියා වූ නාමන්ගේ කුෂ්ඨය සුව කළේ,

(1) එලියා ය. (2) ආමොස් ය. (3) නාතාන් ය. (4) එලීෂා ය.

04. ආබ්‍රහම්තුමාට යාමට සිදු වූ පොරොන්දු දේශය මේ නමින් හැඳින්වේ,

(1) හාරාන් (2) කානාන් (3) බෙතෙල් (4) ඌර්

05. සෙබදිගේ පුත් ජාකෝබ්ගේ සොහොයුරු වන්නේ,

(1) පේදුරුතුමා ය. (2) ඇන්ඩෲතුමා ය.

(3) ජොහාන්තුමා ය. (4) තෝමස්තුමා ය.

06. ජේසුස් වහන්සේව පාවාදුන් ජුදාස් වෙනුවට තෝරාගනු ලැබුවේ,

(1) මතියස්තුමාව ය. (2) පේදුරුතුමාව ය. (3) පිලිප්තුමාව ය. (4) තෝමස්තුමාව ය.

07. දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා සමඟ පොරබදා ජයගත් ජාකෝබ්තුමා ලැබූ නාමය වන්නේ,

(1) විශ්වාසයේ පියා ය. (2) ජාතීන්ගේ පියා ය. (3) ඉශ්‍රායල් ය. (4) ජුදයන්ගේ රජු ය.

08. බොරු සාක්ෂි කීමට අප යොමු කරන්නේ,

(1) සිත ය. (2) යහළු මිත්‍රයන් ය.

(3) ආශාවන් ය. (4) නපුරේ බලවේගය ය.

09. "මම යමකුගෙන් අයුතු ලෙස යමක් ගෙන තිබේනම් ඔහුට .................... ආපසු දෙමි." හිස්තැනට සුදුසු වරණය වන්නේ,

(1) දෙගුණයක් (2) සතරගුණයක් (3) පස්ගුණයක් (4) දසගුණයක්

10. දෙමව්පියන්ට හා වැඩිහිටියන්ට සැලකීමට අපට උගන්වන්නේ,

(1) පස්වන පණතයි. (2) තුන්වන පණතයි.

(3) හයවන පණතයි. (4) හතරවන පණතයි.

- **අංක 11 - 15 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**

11. ......................................................... "දෙවියන් වහන්සේගේ ගෘහය" යන අර්ථයෙන් හැඳින්වේ ය.

12. ප්‍රසාද ස්නාපනය දානය කිරීම ක්‍රිස්තුන් වහන්සේගෙන්ම ලද .........................................................

13. ගෙරාර්හි ගොපල්ලෝ ......................................................... ගොපලුන් සමඟ කලහ කළහ.

14. ......................................................... දෙවියන් වහන්සේ ආබ්‍රහම්තුමා සමඟ කළ ගිවිසුමේ බාහිර සලකුණයි.

15. පැවිදිවරුනට සහයවීම ගිහියන්ගේ .........................................................

( ඊසාක්තුමාගේ / බෙතෙල් / යුතුකමකි / චර්මඡේදනය / පෙනුයෙල් / වගකීමකි. )

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි නම් (✓) ලකුණද, වැරදි නම් (X) ලකුණද යොදන්න.**

16. ජේසුස් වහන්සේ ස්වර්ගාරෝහණය වීමට පෙර අපෝස්තුළුවරුන්ට වගකීම් පැවරූ සේක. ( )

17. විවාහ වන යුවල මරණය දක්වාම එකට ජීවත්වීම ඒකත්වයයි. ( )

18. දෙවියන් වහන්සේ සතු වස්තූන් ආරක්ෂා කිරීමට සත්වන පණතෙන් බැඳේ. ( )

19. පැවිදි පූජකවරු වේදහාර දෙකක් ගනිති. ( )

20. සහෝදර ඒසව් - ජාකොබ්තුමා ඉදිරියේ සත්වරක් වැඳ වැටී සමාව ලබාගත්තේ ය. ( )

(ල. 2x20 = 40)

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

01. (i) සුළු දිවැසිවරු දෙදෙනෙකු නම් කරන්න.
(ii) ප්‍රසාද ස්නාපනය දානය කිරීමේ දී භාවිතා කරන සංකේත දෙකක් ලියන්න.
(iii) ආදිපිතෘ ජාකෝබ්තුමාගේ දෙමව්පියන් නම් කරන්න.
(iv) “එසකියෙල්” යන නාමෙහි අර්ථය කුමක්ද?
(v) ආශිර්වාදකාර බන්ධනයේ පාර්ශවකරුවන් නම් කරන්න.
(vi) පූජක නොවන පැවිදි අය බෙදෙන කොටස් දෙක නම් කරන්න.
(vii) ආබ්‍රහම්තුමා සමඟ ඇතිකරගත් ගිවිසුමේ වැදගත් කරුණු දෙක නම් කරන්න.
(viii) ආදිපිතෘ ජාකෝබ්තුමා දුටු දර්ශනය වීම් දෙක නම් කරන්න.
(ix) කතෝලික පූජාප්‍රසාදීන් වහන්සේලා බෙදෙන ප්‍රධාන කොටස් දෙක ලියන්න.
(x) ගිහි කැඳවීම තුළ ඔබට පැවරෙන වගකීම් දෙකක් ලියන්න. (ල. 2x10=20)

02. (i) පූජකවරුන්ගේ මංගල්‍ය දිනය යෙදී ඇත්තේ කවදාටද? (ල. 02)
(ii) පූජකවරයෙහි ධූර තුන නම් කරන්න. (ල. 03)
(iii) පූජාප්‍රසාදීන් වහන්සේලා වෙනුවෙන් අප විසින් ඉටු කළයුතු යුතුකම් පහක් ලියන්න. (ල. 05)

03. (i) කිතුනු විවාහයේ ලක්ෂණ දෙක නම් කරන්න. (ල. 02)
(ii) දරුවන්ගෙන් දෙමව්පියන්ට ඉටුවිය යුතු යුතුකම් තුනක් ලියන්න. (ල. 03)
(iii) ඔබගේ දෙමාපියන් වෙනුවෙන් යහපත් දිවි පෙවෙතක් පතා යැදුමක් ලියන්න. (ල. 05)

04. (i) ජේසුස් වහන්සේ තෝරාගත් ප්‍රථම ශ්‍රාවකයන් දෙදෙනා නම් කරන්න. (ල. 02)
(ii) ජේසුස් වහන්සේගේ ප්‍රථම ශ්‍රාවකයන් සතු වූ ගුණාංග තුනක් ලියන්න. (ල. 03)
(iii) ජේසුස් වහන්සේ ලොවට හඳුන්වාදීමට ඔබට කළ හැකි දේවල් පහක් ලියන්න. (ල. 05)

05. (i) පුරාණ ගිවිසුමේ දිවැසිවරුන් බෙදෙන ප්‍රධාන කොටස් දෙක ලියන්න. (ල. 02)
(ii) ප්‍රධාන දිවැසිවරුන් තිදෙනා නම් කරන්න. (ල. 03)
(iii) දිවැසිවර කැඳවීම තුළ ඔබට පැවරෙන වගකීම් පහක් ලියන්න. (ල. 05)

06. (i) අනනියස් සහ සපිරා කඩ කළ පනත කුමක්ද? (ල. 02)
(ii) වස්තුව හා දේපළ අවංකව ලබාගත යුතු ආකාර තුනක් ලියන්න. (ල. 03)
(iii) සත්‍යගරුක සමාජයක් ගොඩනැගීමට ඔබට කළහැකි දේවල් පහක් ලියන්න. (ල. 05)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. ( 2 ) 02. ( 1 ) 03. ( 4 ) 04. ( 2 ) 05. ( 3 ) 06. ( 1 ) 07. ( 3 ) 08. ( 4 ) 09. ( 2 ) 10. ( 4 )

11. බෙතෙල් 12. වගකීමකි. 13. ඊසාක්තුමාගේ 14. චර්මඡේදනය 15. යුතුකමකි.

16. (✓) 17. (X) 18. (✓) 19. (X) 10. (X)

## II කොටස

01. (i) හොසියා / ජෝවෙල් / අමෝස් / ඔබදියා ( පිටු අංක 02)

(ii) ක්‍රිස්මා තෛලය / සුදු වස්ත්‍රය / ජලය / ඉටි පහන (පාස්කු)

(iii) ඊසාක්, රෙබෙකා.

(iv) දෙවියන් වහන්සේ ගලවන සේක.

(v) මනාලයා හා මනාලිය

(vi) පැවිදි සොයුරන් හා පැවිදි සොයුරියන්

(vii) විශාල දරු පරපුරක් සඳහටම හිමිවන දේශයක්

(viii) බෙතේල්හි දර්ශනය, පෙනුයෙල්හි දර්ශනය

(ix) පදවි පූජක, පැවිදි පූජක

(x) ♦ සමිති සමාගම්වල ක්‍රියාකාරී ලෙස කටයුතු කිරීම. ♦ දිව්‍ය පූජාවට භක්තියෙන් සහභාගී වීම. යනාදි පිළිතුරු සලකා බලන්න. (ල. 2x10=20)

02. (i) මහ බ්‍රහස්පතින්දා (ල. 02) (ii) තේවාචාරි, පූජක හා රාජගුරු (ල. 03)

(iii) ♦ ඔවුන් උදෙසා යාච්ඤා කිරීම. ♦ ජනවන්දනා කටයුතුවලට සහය වීම. ♦ ශු. සභාවට ආධාර ලබා දීම, ♦ දේව රාජ්‍ය පතල කිරීමට සහය වීම. (ල. 05)

03. (i) ඒකත්වය, අඛණ්ඩත්වය (ල. 02)

(ii) ♦ දෙමව්පියන්ට ගරු කිරීම. ♦ වැඩවලට උදව් කිරීම. ♦ අසනීපවලට පිහිට වීම. (පිටු අංක 62) (ල. 03)

(iii) ශිෂ්‍යා ලියා ඇති ආකාරය අනුව ලකුණු ලබා දෙන්න. (ල. 05)

04. (i) පේදුරු, ඇන්ඩෘ, ජොහාන්, ජාකොබ්. (ල. 02)

(ii) ♦ ජේසුස් වහන්සේගේ වචනයට කීකරු වීම. ♦ ජේසුස් වහන්සේ අනුව ගියහ. ♦ ජීවිතයේ මුල් තැන ජේසුස් වහන්සේට දුන්හ. (පිටු අංක 37) (ල. 03)

(iii) ♦ හොඳින් ශු. ලියවිල්ල අධ්‍යයනය කිරීම. ♦ දේව ප්‍රසාද නිධාන ලබා ගැනීම. ♦ නොකඩවා ජන වන්දනාවට සහභාගී වීම. (ල. 05)

05. (i) දේශක දිවැසිවරු, ලේඛක දිවැසිවරු. (ල. 02) (ii) යෙසායා, ජෙරමියා, එසකියෙල්. (ල. 03)

(iii) ♦ සත්‍යවාදීව කටයුතු කිරීම. ♦ වැරදි මාර්ගවලට ඇදී යන පුද්ගලයන් නිවැරදි මාර්ගයට ගැනීම. ♦ සත්‍ය වසන් කරන අයට අභියෝග කිරීම. ♦ නිවැරදි දේ කිරීමට අන් අයට මඟ පෙන්වීම. ♦ ශු. බයිබලයෙහි ඇති පණිවිඩය අන් අයට ප්‍රකාශ කිරීම. (ල. 05)

06. (i) අටවන පනත / බොරු සාක්ෂි නොකියව. (ල. 02)

(ii) ♦ අවංකව වැඩ කිරීමෙන්. ♦ මිලට ගැනීම. ♦ තැගි වශයෙන් (පිටු අංක 74) (ල. 03)

(iii) ♦ සෑම විට ඇත්ත කතා කිරීම. ♦ අවංක වීම. ♦ අසත්‍ය තොරතුරු ප්‍රචාරය නොකිරීම. ♦ නොදන්නා දේවල් හා පුද්ගලයන් පිළිබඳ කතා නොකිරීම. (ල. 05)